රකථන /தொலைபேசி இல./Telephone Nos.

ඇමතිතුමා / அமைச்சர் / Minister } 2784832 Fax: 2784825

ලේකම් / செயலாளர் / Secretary } 2784812

කාර්යාලය / அலுவலகம் / Office } 2785141-50 Fax: 2784846

ඊමේල්/ஈ-மெயில்/E-mail : isurupaya@moe.gov.lk

ඔබේ අංකය / உமது இல. / Your No. } ......................

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

"ඉසුරුපාය"
බත්තරමුල්ල.
'இசுருபாய'
பத்தரமுல்ல.
"Isurupaya"
Battaramulla.


මගේ අංකය / எனது இல. / My No. } ඊඩී/05/68/3/1/40

දිනය / திகதி / Date } 2006.09.18

චක්‍රලේඛ අංක 2006/36

සියලුම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්.
පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්.
කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් වෙත.

## උපාධිධාරී නවක ගුරුවරුන් වෘත්තියාභිමුඛ කිරීමේ ත්‍රෛමාසික සේවාස්ථ ගුරු සහතික පත්‍ර පාඨමාලාව සඳහා අධ්‍යයන නිවාඩු ලබා දීම.

2005/2006 වසරවලදී ශ්‍රී ලංකා ගුරු සේවයට බඳවා ගන්නා ලද උපාධිධාරීන් සඳහා පවත්වනු ලබන වෘත්තියාභිමුඛ කිරීමේ ත්‍රෛමාසික සේවාස්ථ ගුරු පුහුණු පාඨමාලාව සඳහා පහත සඳහන් පරිදි අධ්‍යයන නිවාඩු ලබා දීමට කටයුතු කරන්න.

02. උක්ත පාඨමාලාව සඳහා සහභාගී වන ගුරුවරුන්ට එම පාඨමාලාවට සහභාගී වීමට හැකිවන සේ සතියේ සිකුරාදා හෝ සඳුදා දිනයන්ගෙන් සතියට එක් දිනක් පමණක් සම්පූර්ණ වැටුප් සහිත අධ්‍යයන නිවාඩු ලබා දිය යුතුය.

03. මෙම නිවාඩු ලබා දීමේදී රාජකාරී ස්ථානයේ සිට කිලෝ මීටර් 50 ක් හෝ ඊට වැඩි දුරක සිට පැමිණෙන නවක ගුරුවරුන් සඳහා පමණක් මෙම නිවාඩු ලබා දිය යුතු අතර කිලෝ මීටර් 50 සීමාවේ ඇතුළත සිටින අයට මෙම අනුග්‍රහය හිමි නොවන බව කාරුණිකව දන්වමි.

සන්ධ්‍යා විජයබණ්ඩාර.
අතිරේක ලේකම්. (පාලන හා මුදල්.)

අ/කෘ:- ආරියරත්න හේවගේ.
ලේකම්.
අධ්‍යාපන අමාත්‍යාංශය.

පිටපත:- ප්‍රධාන කොමසාරිස් (විද්‍යාපීඨ ශාඛාව)